# ශ්‍රී ලංකාවේ රැකියා නියුක්තිය හා ද්විතීක රැකියාවන්හි නියුතුවන ජනගහනය





**මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව**

කේ.කේ.ඩී.කේ.එස්.සෝමරත්න

(සංවර්ධන නිලධාරි)

# ශ්‍රී ලංකාවේ රැකියාවල නියුතුවූවන් හා ද්විතික රැකියාවන්හි නියුතුවන ජනගහනය

## 1.1හැදින්වීම

රැකියාවක නිරතවන යනු සලකන ලද කාල පරාසයක රැකියා නියුක්ත,සේවා යෝජක,තමන්ගේම වැඩ කටයුතු කරන්නා,පවුලේ කටයුතුවලට දායකවන්නා යන කුමන ආකාරයක හෝ කාර්යයක නිරත වන්නා රැකියා නියුක්ත වූවකු ලෙස හඳුන්වයි. මෙහිදී සලකන ලද කාල පරාසය යනු සමීක්ෂන සතියට පෙර සතියක කාලයයි. නමුත් ද්විතීක රැකියාවක නිරතවන්නා යනුවෙන් හඳුන්වන්නේ සලකන ලද අවස්ථාවකදී ප්‍රධාන ආර්ථික කටයුත්ත හැර තවත් අමතර රැකියාවක යෙදෙන්නන් ද්විතීක රැකියා නියුක්තවන්නන් ලෙස හඳුන්වයි. දත්ත රැස් කිරීමේ පහසුව සඳහා ප්‍රධාන රැකියාව හා තවත් එක් රැකියාවක් පමණක් නිරත වන අය ගැන පමණක් අධ්‍යයනය කෙරේ.

## 2.1රැකියා නියුක්තිය හා මුළු රැකියාවන්හි ව්‍යාප්තිය ප්‍රධාන රැකියාව හා ද්විතීක රැකියා අනුව

| වසර | රැකියාව | | | | | | රැකියාවන් |
|---|---|---|---|---|---|---|---|
| | මුළු ගණන | % | ප්‍රධාන රැකියාව | % | ප්‍රධාන හා ද්විතික | % | මුළු ගණන |
| 2013 | 7,681,279 | 100.0 | 6,945,318 | 90.4 | 735,960 | 9.6 | 8,417,239 |
| 2014 | 7,700,489 | 100.0 | 7,033,442 | 91.3 | 667,047 | 8.7 | 8,367,537 |
| 2015 | 7,830,976 | 100.0 | 7,130,847 | 91.1 | 700,129 | 8.9 | 8,531,105 |
| 2016 | 7,947,683 | 100.0 | 7,070,055 | 89.0 | 877,628 | 11.0 | 8,825,311 |
| 2017 | 8,208,179 | 100.0 | 7,516,061 | 91.6 | 692,114 | 8.4 | 8,900,297 |

මූලාශ්‍රය:ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව,ශ්‍රමබල සමීක්ෂණ වාර්ෂික වාර්තාව-2017

රැකියා නියුක්තියෙන් ප්‍රතිශතයක් ලෙස ද්විතික රැකියා නියුක්තිය ඉහතින් දක්වා ඇත. **2016 වසර වනවිට 10% ට වඩා ඉහල අගයක් දක්වා ද්විතික රැකියාවන්හි නියුක්ත ප්‍රතිශතය වැඩිවී ඇතත් 2017 වසර වන විට නැවත එය 8.4 දක්වා අඩුවී ඇත.**

## 2.2 අංශයන් අනුව ප්‍රධාන රැකියාව හා ද්වීතික රැකියාවන් හි ව්‍යාප්තිය




මූලාශ්‍රය:ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව,ශ්‍රමබල සමීක්ෂණ වාර්ෂික වාර්තාව-2017

අංශ අනුව ගත්විට ද්විතිය රැකියාවන් හි නියුතුවූවන්ගේ වැඩිම ප්‍රතිශතය දක්නට ලැබෙන්නේ **ග්‍රාමීය අංශයේය**.ද්විතික රැකියා නියුක්තියේ අඩු ප්‍රතිශතය දක්නට ලැබෙන්නේ නාගරික අංශයේය.

### 2.3 රැකියා තත්ත්වය හා ස්ත්‍රී පුරුෂ භාවය අනුව ද්විතීක රැකියාවන්හි ව්‍යාප්තිය-2017




මූලාශ්‍රය:ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව,ශ්‍රමබල සමීක්ෂණ වාර්ෂික වාර්තාව-2017

ඉහත දත්තයන්ට අනුව පවුලේ ආර්ථික කටයුතු වලට දායකවන්නන්ගෙන් 60.3% ක් කාන්තාවන් වන අතර, පිරිමින් 39.7%කි.ඉතිරි කාණ්ඩ තුනහිම පිරිමි ප්‍රතිශතය ගැහැණුන්ට වඩා වැඩිය.

### 2.4 අධ්‍යාපන තත්ත්වය අනුව ද්විතික රැකියාවන්හි ප්‍රතිශත ව්‍යාප්තිය -2017




මූලාශ්‍රය:ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව,ශ්‍රමබල සමීක්ෂණ වාර්ෂික වාර්තාව-2017

ඉහත රූප සටහනට අනුව වැඩිම ප්‍රතිශතයක් ද්වීතීක රැකියාවල නිරතවන්නේ අධ්‍යාපන මට්ටම 6-10 ශ්‍රේණිවල අධ්‍යාපනය ලැබූ පිරිසයි. අඩුම ප්‍රතිශතයක් නිරතවී තිබෙන්නේ G.C.E.(O/L) මට්ටමේ අධ්‍යාපනය ලැබූ අයයි.

### 2.5 වෘත්තීය කාණ්ඩ අනුව ද්විතීය රැකියා ව්‍යාප්තිය-2017

| වෘත්තීය බාණ්ඩයන් | ද්විතීය රැකියා ජනගහනය | |
|---|---|---|
| | ගණන | % |
| **මුළු ගණන** | 692,118 | 100.0 |
| කළමණාකරුවන්,ජ්‍යෙෂ්ඨ නිලධාරින් හා නීති සම්පාදකයින් | 26,512 | 3.8 |
| වෘත්තිකයන් | 43,267 | 6.3 |
| තාක්ෂනඥයින් හා සහය වෘත්තිකයින් | 14,339 | 2.1 |
| ලිපිකරුවන් හා ලිපිකරු ආශ්‍රිත රැකියා | 2,406 | 0.3 |
| විකුණුම් හා සේවා | 25,320 | 3.7 |
| පුහුණු කෘෂිකර්ම, වන හා ධීවර | 342,775 | 49.5 |
| ශිල්පීය හා ආශ්‍රිත වෙළඳ | 71,573 | 10.3 |
| යන්ත්‍ර හා යාන්ත්‍රික හසුරුවන්නන් | 47,230 | 6.8 |
| මූලික රැකියා | 118,261 | 17.1 |
| ආරක්ෂක හා වර්ගීකරණය නොකල | 434 | 0.1 |

මූලාශ්‍රය:ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව,ශ්‍රමබල සමීක්ෂණ වාර්ෂික වාර්තාව-2017

ද්විතික රැකියාවන්හි නිරතවන වෘත්තීය කාණ්ඩ අනුව සැලකූ විට වැඩිම පිරිසක් ඇත්තේ පුහුණු කෘෂිකර්ම,වන හා ධීවර වෘත්තීය කාණ්ඩවල රැකියා කරන්නන්ය. අඩුම පිරිසක් නිරතව සිටින්නේ ආරක්ෂක හා වර්ගීකරණය නොකල කාණ්ඩයට අයත් වූවන්ය.

### 2.6 ප්‍රධාන කර්මාන්ත බාණ්ඩයන්ට අනුව ද්විතික රැකියාවන්, අවිධිමත් හා විධිමත් ක්ෂේත්‍රයන්ට දක්වන දායකත්වය-2017




මූලාශ්‍රය:ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව,ශ්‍රමබල සමීක්ෂණ වාර්ෂික වාර්තාව-2017

කෘෂිකර්ම ක්ෂේත්‍රයේ නිරතවන 97% අවිධිමත් ලෙස ද්විතික රැකියාවන්හි යෙදේ.විධිමත් කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ නිරත පිරිස 2.6% කි.කර්මාන්ත හා සේවා අංශවල පිළිවෙලින් 87.4% හා 84.3% යන ප්‍රතිශතවලින් ද්විතික රැකියාවල යෙදී ඇත.

**2.7 වයස් කාණ්ඩයන්ට අනුව මුළු රැකියා ගණනේ ව්‍යාප්තිය-2017**

| වයස් කාණ්ඩ | ප්‍රධාන රැකියා | % | ද්විතික රැකියා | % | මුළු රැකියා | % |
|---|---|---|---|---|---|---|
| **මුළු ගණන** | 8,208,179 | 100.0 | 692,118 | 100.0 | 8,900,297 | 100.0 |
| **15-19** | 172,712 | 2.1 | 4,428 | 0.6 | 177,140 | 2.0 |
| **20-24** | 623,378 | 7.6 | 18,240 | 2.6 | 641,617 | 7.2 |
| **25-29** | 757,518 | 9.2 | 31,195 | 4.5 | 788,713 | 8.9 |
| **30-39** | 1,918,741 | 23.4 | 151,214 | 21.8 | 2,069,955 | 23.3 |
| **40& ඉහල** | 4,735,830 | 57.7 | 487,042 | 70.4 | 5,222,872 | 58.7 |

මූලාශ්‍රය:ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව,ශ්‍රමබල සමීක්ෂණ වාර්ෂික වාර්තා-2017

ද්විතික රැකියාවල යෙදෙන පිරිස වැඩිම ඇත්තේ වයස අවු 40 හා ඉහල වයස් කාණ්ඩයේ පිරිසටයි. අවු 15-19 වයස් කාණ්ඩයේදි ද්විතීක රැකියාවල යෙදෙන ගණන අඩුම පිරිසයි. එක් රැකියාවකට අමතරව තවත් රැකියාවකින් ආදායම් උත්පාදනය කරන පිරිස වයස වැඩි වීමේදී වැඩිවී ඇත.

***වැඩිම ප්‍රතිශතයක් ද්විතික රැකියා වල යෙදී ඇත්තේ 2016 වසරේදිය.**

***අංශ වශයෙන් ගත්කල වැඩිම පිරිසක් ද්විතීක රැකියාවල යෙදෙන්නේ ග්‍රාමීය අංශයෙනි.**

***පවුලේ ආර්ථික කටයුතුවලට දායක වන කාන්තාවන් වැඩිම ප්‍රතිශතය වාර්තා කරන අතර සේව්‍ය, සේවක හා තමන්ගේම වැඩකටයුතුකරන්නා යන තත්ත්ව වලදී පුරුෂයන් වැඩිම ප්‍රතිශතයක් ද්විතික රැකියාවල නිරතවේ.**

***2017 වසරේදී 6-10 ශ්‍රේණිවල අධ්‍යාපනය ලැබූ පිරිස වැඩිම ද්විතික රැකියා ගණනක නිරතවේ.**

***වෘත්තීය කාණ්ඩයන් සැලකූකල කෘෂිකර්ම වන හා ධීවර ක්ෂේත්‍ර යන කාණ්ඩ යේ වැඩිම පිරිසක් ද්විතීක රැකියාවල යෙදීමක් දක්නට ඇත.**

***වයස අවු 40 හා ඉහල කාන්ඩයේ පිරිස 2017 වර්ෂයෙදී ද්විතික රැකියාවල බහුතර වශයෙන් යෙදී ඇත.**